# අඟුල් මල් දමනය

**දැමු පරිදි :-** හික්ම වූ අන්දම

**රෑ පුතකු ප්‍රසව කළා :-** රාත්‍රියේදී පුතෙකු වැදුවාය (රත්ති භාගේ ගබ්භ වුට්ඨානං අහොසි - අට්ඨකථාව)

**නකත් තරු :-** ග්‍රහ පිහිටීම

**සොර නකතකින්:-** සොරුන් උපදින නැකතකින්

**පිළවිත :-** ඇසුවේය

**නො සුවය :-** හොඳ නැත

**නො බව :-** බය නොවන්න

**මතු නොවෙයි :-** පමණක් නොවෙයි

**පුළුවුත්තෙන් :-** ඇසූ නිසා

**රට පහරන්නට :-** රට විනාසන්නට

**වෙයි හො :-** වෙයි වත්ද

**උහු හැර පිය මැනව :-** ඔහු අතහැර දමන්න

**කුම් කෙරෙයි :-** මොනවා කරන්නද

**පිළදඟුව :-** පෝෂණය කරගන්න

**වියපත් කල්හි :-** වයසින් මෝරා ගිය පසු

**වත් සපනෑ :-** සිරිත් විරිත් වලින් දක්ෂය,හොඳ ගති පැවතුම් ඇත්තේය

**බෙණෙයි :-** කතා කරයි

**මන වඩන :-** සිත් ගන්නා සුලු, ආදරය හිතෙන ලෙස

**පිටත් වූහු :-** ඇත් වී ගියේය

**මාණවකයා :-** තරුණයා, ශිෂ්‍යයා, ගොලයා

**ඇපි නො පෙනෙම්හ :-** අප පෙනෙන්නේ නැතිව ගිහින්

**උහු :-** ඔහු / ගුරුතුමා

**කිසෙ බිඳුම්හ :-** ඈත් කරවන්නේ කෙසේද

**බැණෑ ගන්නාහු :-** කතිකා කර , කතා කරමින්

**ජන්ම ඇත්තෙන් :-** වැදගත් පවුලක උපන් නිසා

**අජන්මවතැයි :-** කුලයෙන් පහත් යැයි

**අඹුව හා :-** බිරිඳ සමඟ

**සසඟ :-** නොමනා සම්බන්ධයක්,අනියම් ඇසුරක්

**තුන් රැසක් ව :-** පිරිස් තුනකට බෙදී

**ඇසෙන දෙයක් :-** කටකතාවක්, ඇසූ දෙයක්

**කිමෙක හො :-** ඒ මොකද්ද

**වරද්දයි ගත්තම්හයි :-** වරදවා තේරුම් ගෙන

**දැහැව :-** කෙන්තියෙන්

**යටත්නි :-** අතවැසියනි

**නො බිඳ :-** වෙන් කරවන්නට

**පියැටියාව :-** කටයුතු කරන්න එපා

**නෙරපීය :-** පන්නා දැම්මේය

**අනෙක් වටැ :-** ඊළඟ වතාවේ

**අනෙක් රැස :-** අනිත් පිරිස

**නො හදහා නම් :-** අවිශ්වාස නම්,පිළිගන්නේ නැතිනම්

**සනා ඇතිවැ :-** ආදරය නිසා

**බිඳී :-** කේන්ති ගෙන

**වටලා :-** නැවත,ආයෙත්

**වන්නා හා :-** වීමත් සමඟ

**ලාභ පිරිහෙයි :-** ආදායම් අඩුවෙයි

**ශිල්ප සමහරයට :-** ශිල්ප උගන්වා අවසාන හෙයින්

**උපචාර යැ :-** පූජාව යැයි/පඬුරු යැයි

**එකෙක් ඔහු මරයි :-** වෙනත් කෙනෙකුගෙන් මැරුම් කාවි

**ඇපි අන්නට :-** අපි වෙනත් අයට

**නොකට හැක්ක :-** කරන්නට බැහැ

**නොකරන්නා :-** නොකරොත්

**එල නොදෙයි :-** ප්‍රයෝජනයක් නොලැබෙයි

**පඤ්චායුධ :-** ආයුධ වර්ග පහ (දුන්න,කඩුව,අඩයටිය,තෝමරය,හෙල්ල)

**අටවියට :-** කැලයට

**වදනා තන්හි :-** ඇතුළුවන තැනදීත්

**පිළී ඈ :-** රෙදි පිළි ආදිය

**ගනන් මතු කෙරෙමින් :-** ගණන වැඩි කර ගනිමින්

**පණිවා කරනුවන්:-** සතුන් මරන අයට

**සිත් නොපිහිටනා :-** අමතකවන නිසා

**ගණනුදු නො දත :-** ගණන්ද වරදියි/අමතකවෙයි

**එකෙකි නස්සි :-** එක එක විනාශවෙයි

**ඇඟිලි විදැ :-** ඇඟිලි හිල් කර

**මාලා කොට ධැරීය :-** මාලයක් ලෙස පැළඳ ගත්තේය

**හසර :-** ඇවිදින

**දර පලා :-** දර හා කොළ වර්ග

**වල් යන්නාහු :-** කැලයට යන අය

**පයින් පැහැර :-** කකුලෙන් ගසා

**ගලවා පියා :-** ගලවා දමලා

**හොතුවන් :-** නිදාගෙන සිටින්නන්

**ගම් පියා :-** ගම් අත් හැර

**නියම් ගම් :-** නගර/ලොකු ගම්මාන

**තුන් යොජනක් :-** යොදුන් තුනක් (කි:මි: 72ක්/සැතපුම් 16ක්)

**ගෙ පියා :-** ගෙවල් ඇතහැර

**රාජාඞ්ගණයෙහි :-** රජ මාළිගාවෙ මිදුල

**වලපිත් :-** වැලපෙති

**මපිත් වන්නේ වෙයි :-** මගේ පුතා වෙන්නැති

**සොරෙක් උපන :-** සොරෙක් බිහිවෙලා

**තී පිත් :-** ඔබගේ පුතා

**ඔහු ගන්නට :-** ඔහු අල්ලන්නට/මරා දමන්නට

**ගෙන එයි :-** ගෙන එන්න/එක්කගෙන එන්න

**නො තිස්සෙමි :-** තුසුදුසු වෙමි

**මා සබදහ :-** මගේ මිතුරෙකි

**අතොට හුන් :-** බිම දමාගෙන/එළාගෙන

**වලද ගත්තේයැ :-** පාවිච්චියට/ප්‍රයෝජනයට ගත් ඒවාය

**නො ද කටයුත්තේයැ :-** නොකළ යුතුය

**වශ්‍යයැයි :-** ආදරයෙන් සිටියා යැයි

**ළ මෙළක්ය :-** හදවත මොළොක්

**අලුයම් සමාහි :-** පාන්දර යාමයෙහි

**ලො බලන්නාහු :-** ලෝකය බලන්නේ

**ගම් නැති තැන :-** ගම් වලින් ඉවත්ව

**මහ වල්හි :-** මහා වනාන්තරයෙහි

**පැව්ජි වැ :-** මහණ වී

**රාත් :-** රහත් ව

**සිවුපද ගයක් :-** පද සතරකින්

**නොනැඟිය හැකි :-** ගොඩ එන්න බැරි

**සුගත් :-** බුදුන් වහන්සේ

**සහපවුල් :-** උතුම් පාංශුල සිවුර

**හැඳ පෙරව :-** ඇඳපොරවගෙන

**කටැව්ව :-** කරනු කැමතිව

**අධන් මඟ :-** දුර මඟ/දීර්ඝ මාර්ගය

**පිළී පන්හු :-** පිවිසියහ

**සහන්නාහු :-** සී සාමින් සිටින අය

**එකලා වැ :-** තනිවම

**නො යා :-** යන්න එපා

**දරුණු :-** දරුණුය/නපුරුය

**ලෙහෙ මඬු :-** ලේ ගැවුණ

**කුලුණු :-** කරුණාව/මෛත්‍රිය

**තෙල මගට :-** ඒ පාරට

**සන්නද්ධව :-** සටන් කිරීමට සූදානම්ව

**වග වග/ ව :-** කණ්ඩායම් ලෙස

**සොරහු අතැ නස්නී :-** සොරාගෙන් මැරුම් කති

**තුන් යලක් :-** තුන් වතාවක්

**කියත දූ :-** කියද්දීත්

**නැඟී වැඩියෝ :-** ඉදිරියට ම වැඩියේය

**සොර දූ :-** සොරාත්

**දුබ්භෝජනයෙනුදු :-** ආහාරයක් හරි. හැටි නොලැබීමෙන්

**දුක්ඛසෙයයායෙනුදු :-** දුක සේ නිදාගැනීමෙන්ද

**උකටලිව :-** හෙම්බත් වී/ උදාසීනව

**එකක්හු උනු දහසක් :-** දහසකට එක්ක අඩු (999)

**හේ වනාහී :-** එය වූ කලී/ඒ ප්‍රමාණය

**දැළි කප්වා :-** උඩු රැවුල කපා දමා

**නහා පිළී පෙරළා :-** නා ඇඳුම් මාරු කොට

**මඟින් පහ වැ :-** පාරෙන් ඉවත්ව

**එතෙකුදු හොත් :-** එසේ වුවත්

**අභිභවමින් :-** යටපත් කරවමින්

**කඩු පළඟ :-** කඩුවත් පලිහත්

**දුන් හියොවුර :-** දුන්න හා ඊතල දමන කොපුව

**පියවි ගමනින :-** සාමාන්‍ය ගමනින්

**බැල පමණින් :-** උපරිම ශක්තියෙන්

**දිවනුයෙ :-** දිව්වත්

**පස් පස් :-** පසුපසින්

**හඹාගත :-** ලුහු බැඳගන්නට

**අධිෂ්ඨානයක් :-** පැතීමක්/ ප්‍රාර්ථනාවක්

**ඔහු ඇර :-** ඔහු අල්ලාගෙන

**බහ බහා සිටුවයි :-** පස්සට පස්සට තල්ලු කොට දමයි

**හී සනක් :-** ඊතලයක් යන තරම් දුර

**පියා යෙයි :-** පසු කොට යයි

**අඬගනයක් :-** මිදුලක්/පිට්ටනියක්

**තුමූහු මධ්‍ය වෙති :-** තමා එහි මැදින් වෙයි

**හෙ අන්තය වෙයි :-** ඔහු කෙළවර වෙයි

**වෙළෙව්ව :-** ඉක්මන් වී /වේගවත්ව

**ක්ලානත වීය :-** සිහිසුන්වී

**මියෙහි :-** කටෙහි

**ස්වේද බස්සි :-** දහඩිය ගලයි

**ගනිම් මැ යැ :-** ගන්නවාමයි

**එතෙකුදු හොත් :-** ඒසේ වුවද

**සෑ මහණුහු :-** ශාක්‍ය වංශ හාමුදුරුවෝ

**සබව් කියති :-** ඇත්ත/ සත්‍යය කියති

**සිට යි යෙයි :-** සිටින්නේ යැයි කියයි

**පිළිවිස :-** අසා /විමසා

**සිටියෙමියි යෙහි :-** සිටියෙමියි කියන්නෙහි

**දඬෙක් :-** දඬුවමක්

**ක්ෂාන්ති මෛත්‍රියැ :-** සාන්තිය හා කරුණාව

**නොසිටි වන බැවින් :-** අනුගමනය නොකරන නිසා

**ඉරියවු :-** හැසිරීම

**නිරයැ :-** නරක වැඩ/අපාය

**තිරිසන් යොනි යැ :-** තිරිසන් ගත ආත්ම වල

**ප්‍රේත විෂයයෙහි :-** පෙරේත ලෝකවල

**අසුර කායෙහි :-** අසුර ලෝකයෙහි

**සිංහනාදයක් :-** සිංහයෙකුගේ වැනි බය නැති කතාවක්/උතුම් හඬක්

**ගර්ජනා යැ :-** අභීත හඬකි/හඬ නැඟීමකි

**දක්නා ලද බන්දෙමි :-** දැක්කා වගේ වෙමි

**මෙයට වැඩියහ :-** මෙහාට වැඩියෝය

**ප්‍රපාතයෙහි :-** කඳු පාමුල

**බහා පියා :-** අතහැර දමා

**පැවිජ අයදිය :-** පැවිද්ද ඉල්ලුවේය

**ඒහි භික්ඛු භාවයෙහි :-** එන්න මහණ යනුවෙන් පැවිද්ද දී

**කර සෙවුව මැනව :-** දැළි පිහියකින් කෙස් රැවුල් කපා දැමිය යුතුය

**පා සිවුරු :-** පාත්‍රය හා සිවුරු

**කිස :-** කටයුතු

**එ මහණෑ යි :-** එන්න මහණ

**සෘද්ධිමය :-** සෘද්ධියෙන් ලැබුන

**ප්‍රතිමුක්ත විය :-** පැලඳුණි/ඒතුණේය

**හෙ මෑ:-** එය ම

**උපසපන්කම :-** උපසම්පදාව

**ඇත්තේ නො වෙයි :-** අවශ්‍ය නැත

**ගන්වාගෙන :-** පොරව ගෙන

**අට ඉස්බක් :-** කිලෝමීටර් ½ක් තරම් දුර

**අන්තරිතව :-** අතර ඇති

**කොයට ගියෙහි :-** කොහෙද ගියේ

**නොබැණෙහි නො :-** කතාකරන්නේ නැතිද

**වැද ඇවිද :-** පැමිණ ඇවිද

**ගෙවද්දොර :-** බමාලිගාවේ දොරටුව වෙත

**දරුණෑ :-** දරුණුය

**ඔහු වළකා :-** එයා වළක්වන්න

**අතැණියෙන් :-** ඇත් සේනාවෙන්

**තිරු කොට ගන්නේය :-** ස්ථිරවම අල්ලා ගනීවී

**අසැණියෙන් :-** අස් සේනාවෙන්

**රථැණියෙන් :-** රිය හමුදාවෙන්

**වටලාගත් කල්හි :-** වට කර ගත් කල

**ඔහු නැඟී :-** ඔහු පැමිණ

**ශබ්ද කරන්නා :-** කෑ ගසන විට

**අවුධ පෙරළන්නට :-** අවි ඔසවන්නට

**කොටා මරයි :-** කපා මරා දමයි

**වල් ඇත් වෙයි :-** ඇතුන් වල් වැදෙයි

**ගිගිරියෙන් :-** උද්ඝෝෂණය නිසා

**පරාජය වී නම් :-** පැරදුණොත්

**සල්හු ව :-** ඉක්මණින්

**බිරි සිතින් :-** හිතේ බයෙන්

**නොයාටි වූයේද :-** යාමට අකමැති වුවත්

**ගරහනු බියෙන් :-** නින්දා කරාවී යැයි බයෙන්

**පුළුවුස්නා දෑය :-** අසාවි/විමසාවි

**බැළ ගෙන :-** බළ සේනාව ගෙන

**පරලොවින්ම සංග්‍රහ :-** පරලොවට උපකාර කිරීමට

**ගිවිස නො බැණ :-** කැමත්ත /අනුමැතිය දී

**දන්තී :-** දනිති

**එකත්පස්ව :-** පැත්තකට වී

**කුපිත විය හො :-** කෙන්ති/තරහ ගත්තා වත්ද

**ප්‍රතිපක්ෂ :-** විරුද්ධ

**දැහැවි :-** කෙන්ති ගත්

**කෙහෙ බහා :-** කෙස් රැවුල් බා

**පණිවා ඈ :-** සතුන් මැරීම් ආදිය

**පවු කැමින් :-** පවු වැඩ වලින්

**විරතව :-** වෙන් වී/ඉවත් වී

**එක් වෙලෙ වළදා :-** එක් වරක් වළදා

**බඹසර වස් :-** බ්‍රහ්මචාරිව සිටීම

**කලණදහම් පුරා :-** කරුණාව මෛත්‍රිය ආදිය පුරමින්

**දිටිහි නම් උඹට :-** දැක්කොත් ඔහුට

**ඇප් අත් වදම්හ :-** මම ඔහුට වදිමි

**සතර පසයෙන් :-** සිවුපසයෙන්

**උපස්ථාන :-** ආවතේව කිරීමෙන්

**කියා තබා :-** කියන අතරම

**උපනිඃශ්‍රය :-** හේතු සම්පත්/වසනා

**උහු ඇර :** - ඔහු රැගෙන

**යහ යයි :-** හදයැයි

**පිරික්සනු :-** පරීක්ෂා කර බලනු

**දුසිල් පවිට හට :-** සිල්වත් කමක් නැති පවුකාරයට

**සීල සංයමයක් :-** සිල්වත් හික්මීමක්/ සංවර කමක්

**එසමාහි :** - එවෙලාවෙ

**නගා :-** ඔසවා

**තුබූ මහජනයෝ :-** එතන සිටි පිරිස

**දසායෙහි හී පලා :-** දිසාවන්ට හැරී පැන දුව ගොස්

**අඟුල ගෙන :-** යතුර දමා ගෙන

**අටල්ලට :-** මැස්සට/සැඳැල්ලට

**රජු ගත :-** රජතුමා අල්ලා ගත්තා

**පලා ආවෝම :-** පැන බේරී ආ නිසා

**දිවි ලදුම්හ :-** පණ බේරා ගත්තෙමු

**නොබව :-** බය නොවන්න

**මේ දැන් :-** මොහු දැන්

**කිහිඹියකුදු :-** කුඹියෙක්වත්

**දිවි නොගලවයි :-** නොමරයි

**සන්හින :-** සන්සිඳුණේය

**අඟුල්මල් දෑ ය හො :-** අංගුලිමාල හාමුදුරුවෝ නේද

**පැවිජියනට :-** පැවිද්දන්ට

දරුණුකමින් ලද නම් :- කරනලද වැඩ නිසා කරන අන්වර්ථ නම

**කියනු නො යෙදෙයි** :- කීම හොඳ මදි/ නරකයි

**ගොත් විසින් :-** පරම්පරාවට සරිලන සේ

**බැවහර කරනු :-** භාවිතයට ගන්න

**පියෙ කවර :-** පියා කවු ද

**වත් හිමියෝය :-** වස්තු හා දේපළ ඇති තැනැත්තා

**අභිරත :-** තදින් ආසා කිරීම

**වෙත්ව යි :-** වෙනවානම්

**කෙරෙම්වයි :-** කරන්නෙමි යි

**බඩු බඳ සළුව :-** ඉණට ඇඳ සිටි රෙද්ද

**තෙළෙස් ජුහඟ :-** ධූතාංග දහතුන

**තුන් සිවුරු :-** තනි පොට,දෙපොට,අඳන යන සිවුරු තුන

**සැපිරූ :-** සම්පූර්ණ වී

**ආශ්චර්ය යෑ :-** අසිරිමත් ය/පුදුමය

**අද්භූතය :-** විශ්වාස කළ නොහැකිය

**අදාන්ත :-** දමනය කරන්නට බැරි

**දමන දෑ ය :-** දමනය කරයි

**අශාන්ත :-** සංවර නැති

**නොපිරිනිවී :-** සියලු දුකින් නිදහස් නොවූ

**කෙලෙස් පිරිනිවනින් :-** පව් සිතුවිලි සම්පූර්ණයෙන් ම නැති කිරීමෙන්

**දඬියෙනුදු සැතිනුදු :-** දඬුවමින් හා අවි වලින්

**බොහෝ කාර්ය :-** වැඩ රාශියක්

**කල් දැන :-** කරුණු සියල්ල දැනගෙන

**පැදකුණු :-** වමට හැරී තුන්වරක් වටේට ඇවිදිමින්

**කුලගම් :-** උපන් ගමට

**සිඟන්නට :-** පිණ්ඩපාතය යෑමට

පලත් මය :- පැන දුවයි

**දොර පියලත් :-** දොර වසා ගනියි

**නො යා හෙන්නාහු :-** යන්නට නොහැකි වූ අය

**පිටි පෑ සිටුති :-** පස්ස හරවා ගනිති

**සරළුවක් හඹු දු :-** හැන්දක්වත් කැඳ

**කෙණෙස්සක් බත දු :-** බත් හැන්දක්වත්

**අහරින් ක්ලාන්ත වෙති :-** කෑම නොලැබීමෙන් හාමත් වෙයි

**සර්ව සාධාරණය යි :-** කාටත් එක සමාන යැයි

**අඟුල්මල් අය යි :-** අංගුලිමාල ආවේ යැයි

**කළු දහස් බිඳිමින් :-** කළ ගෙඩි දහස් ගණනක් බිඳගෙන

**සපදන් සැරී :-** ගෙපිළිවෙළින් පිණ්ඩපාතය යෑම

**මූඪ ගර්භව :-** දරුවා හරහට පිහිටි

**නො වැද හෙන :-** වදාගන්නට නොහැකිව

**මාගමක :-** කාන්තාවක

**මරන්නානට :-** මරන්නාට

**කුලුණු කිසෙ :-** කරුණාව කෙසේද

**අහර කිස :-** ආහාර ගැනීමේ

**සිඟනුයෙම් :-** පිණ්ඩපාත කරද්දී

**නුරුස්සී :-** ඉවසන්නට බැරිව

**දිවි නොගැලවී නම් :-** ජීවිතය තොර නොකළේ නම්

**එසසින් :-** ඒ සත්‍යය හේතුවෙන්

**තිට දූ ගබට දූ :-** ඔබටත් ඔබේ දරු ගැබටත්

**සස් කරා යි :-** සත්‍ය ක්‍රියා කරන්න

**හෙ මට මුසා වෙයි :-** එසේ කිරීමෙන් මට බොරු කීමක් වෙයි

**තා ගිහි මිනිස් කලැ :-** ඔබ ගිහි මිනිසෙකුව සිටි කාලයෙයි

**ආර්ය නම් ජාතියෙක් :-** රහත්/ උතුම් නම් උපතක්

**කුකුස් :-** සැක

**නඟා යවූහු :-** ආපසු හරවා යැවුවෝය

**ජවනිකා :-** තිර රෙදි

**ඉහි වැඩ හිඳැ :-** එහි වාඩා වී

**එසස් තෙපුල් :-** ඒ සත්‍ය වචන කිම

**ඩබරායෙන් :-** දිය පෙරනයෙන්

**ගුළු දියක් :-** වැගුරුණු ජලය මෙන්

**දිපිත් මව්හට :-** පුතා සහ මවට

**පිළක් :-** වේදිකාවක්/පුටුවක්

**තිරිසන් ගති යැ :-** තිරිසන් ජීවිත ලබා ඇති

**ඇරැ :-** ගෙනවිත්

**හොවති :-** දිගා කරති

**බර මුසිත් :-** බරින් නිදහස් වී

**පිළ දෙව් දිය :** - ආසනය සේදූ වතුර

**පිළී දෙව් :-** ඇතිරිල්ල සෙදූ

**හස ඔත් කල :-** හසට වක්කළ විට

**කප සිටිනා :-** කල්පය පුරා බල පවත්නා

**පෙළහර :-** ප්‍රාතිහාර්යය

**කිම හො :-** කුමක්ද

**බා පලති :-** බයවී පැන දුවති

**මහණුවම් :-** මහණකම

**නොනිස්සහ :-** නොහැකි වූහ

**පිළ ලදින් :-** ලැබූ බැවින්

**එළඹියැටි :-** ළංවෙන්නට කැමති

**දේදම් :-** වෙද කම්

**කමටහන් :-** කර්මස්ථාන

**පහළ වෙයි :-** සිතේ මැවී පෙනෙයි

**දුගීම් :-** දුප්පතෙක් වෙමි

**මට දිවි දෙව :-** මා මරන්න එපා

**සපන :-** (පොළොවෙ) ගසන

**ආපාතයට :-** මතකයට

**ඒ ජාතය** :- ඒ මිනිස් වර්ගයා පිළිබඳ ආ කල්පනාව

**විපිළිසරව :-** නොසන්සුන්ව

**අබ්බෝහාරික කොට** :- සඳහන් කර

**විදර්ශනාව වඩා** :- භාවනාව සිදු කර

**රාත් බව් ගත්හි :-** රහත් බව ලබා ගනියි

**කවුඩුබලු :-** බලුකපුටන්

**නෙරනා සඳහා :-** පන්නා දමන්නට

**හී සනක් :-** ඊතලය යන දුරක්

**දඬු පහණ හකුරු :-** ලී කොට ගල් බොරලු

**වෙර හෙයි :-** ඇගේ වදියි

**මහ සම් සිදී :-** ලොකු හම කැපී

**බුන් ඉසින් :-** තුවාල වුණ හිසින්

**බුන් පා :-** තුවාල වුණ කකුල් වලින්

**හිණැ හිරුණු :-** ඉණෙහි ඉරුණ

**බ්‍රාහ්මණය :-** උතුම් තැනැත්ත

**ආධිවාසනා කරා :-** ඉවසන්න

**කමක්හුගෙ :-** කර්මයක

**වා දහස් :-** අවුරුදු දහස

**සුවහස් :-** ලක්ෂය/සියක්දහස

**නිරයෑ පස්හි :-** අපායේ දුක් විදියි

**මෙ අත් බැව විඳිහි :-** මේ ජීවිතයේදී විඳින්නෙහිය

**සත් ජවන් සිත්හි :-** ගමන් කරන සිත් හතෙහි

**අනතුරු අත්බැව :-** ඊළඟට පැමිණෙන ජීවිතය

**වටලා :-** නැවත

**ඒ දෙදෙනා :-** ඒ දෙක

**විභාග :-** විස්තර/විවරණ

**ධර්මප්‍රදීපිකා :-** ධර්මප්‍රදීපිකා නම් මහාබෝධිවංශ පරිකථාව

**හෙ බුද්ධ ධර්මය :-** එය (ධර්මප්‍රදීපිකාව) බුද්ධ ධර්මය සම්බන්ධයෙන් ලියූවකි

**මෙ බුද්ධ චරිතය :-** මෙ (අමාවතුර) බුද්ධ චරිතය පිළබඳ ව ලියූවකි

**ගාථාවේ තේරුම**

**දණ්ඩෙනෙක දමයන්ති - අඞ්කුසෙහි කසාහි ච**

**අදණ්ඩෙන අසත්ථෙන - අහං දන්තොම්හි තාදිනා**

සමහර කෙනෙක් දණ්ඩෙන් හෙණ්ඩුවෙන් කසයෙන් ද දමනය කිරීම කරති,නිසල ගුණයෙන් පිරි බුදුන් වහන්සේ විසින් දඬුවලින් තොරව අවි ආයුධ වලින් තොරව මම දමනය කරනු ලැබුවෙමි.

**අත් බැවදු :-** ආත්ම භාවයෙන්/ජීවිතයෙන්

**රාත් මැඟින් :-** රහත් මාර්ගයෙන්

**පතානට :-** පත් වූවන්ට

**එයින් එ වී :-** එම නිසා එලෙස විය

**රහොගතව :-** තනිව හිඳ/හුදකලාව හිඳ

**ඵල සමවත් සුව :-** රහත් පලයට සමවැදීමෙන්

**අමා මහ නිවන් :-** අමාතය මෙන් මිහිරි නිවන් අවබෝධය

**වහල් :-** පිහිට/උදව්

**උදන් ඇනුහු :-** සතුට පැවසූහ

**ආදී ශබ්දයෙන් ගත් :-** පෙර කියන ලද ආකාරයට

**හෙරණපාණන්** :- සාමණේර

**කෙළ දරුවන් :-** විශාල පිරිසක්

**කෙළකන් සුණු :-** කෙළකන් සෝණ

අඟුල්මල්දමන නම් සත් වන පරිච්ඡේදය

නිමි.